# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1837/45 - 2013 නොවැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2013.11.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ වැලිවැටිතුරෙයි නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

උතුරු පළාතේ පළාත් සභාවට තේරී පත් වීම හේතු කොට ගෙන වැල්වැටිතුරෙයි නගර සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

කනකලිංගම් සිවාජිලිංගම් නම් වූ සභිකයා අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ වැල්වැටිතුරෙයි නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට ඉහත කී, ආඥාපනතේ 65අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන සක්තිවේල් ප්‍රදීපන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වැල්වැටිතුරෙයි නගර සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමණියම් අච්චුදන් වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සක්තිවේල් ප්‍රදීපන් මහතා වැල්වැටිතුරෙයි නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
වැල්වැටිතුරෙයි නගර සභාව.

2013 නොවැම්බර් මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
යාපනය.

12 - 205

1A - G 18575 — 180 (2013/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ යාපනය මහ නගර සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණ නොසිටීම හේතු කොට ගෙන යාපනය මහ නගර සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

මුරුගයියා කෝමහන් නම් වූ සභිකයා අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ යාපනය මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට ඉහත කී, ආඥාපනතේ 65අ (2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන කාර්තිගේසු තිල්ලයියම්බලම් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

යාපනය මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී සිවසුබ්‍රමණියම් අච්චුදන් වන මම, (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ (2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කාර්තිගේසු තිල්ලයියම්බලම් මහතා යාපනය මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එස්. අච්චුදන්,
තේරීම්භාර නිලධාරී,
යාපනය මහ නගර සභාව.

2013 නොවැම්බර් මස 13 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
යාපනය.

12 - 206

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.